

# පරිගණකයට එන නව බස් පෙරළිය

ශබ්ද කෝෂ යන්න ඇසෙන විට නිතැතින් ම මතක් වන්නේ පිටු සිය ගණනින් හෝ පිටු දහස් ගණනින් හෝ සමන්විත දැවැන්ත මුද්‍රිත පුස්තකයන් ය. විවිධ භාෂා ඔස්සේ සැකසුණු ශබ්ද කෝෂ වෙළෙඳපොළෙහි තිබේ. එසේ ම එක ම භාෂාවකින් සැකසුණු විවිධ වර්ගයේ ශබ්ද කෝෂ ද විකිණීමට ඇත. මෙවැනි ශබ්දකෝෂ කාලය ගතවීමත් සමගම නොයෙක් ආපදාවලට ලක්වීම, පරිහරණයේ දී ඇතිවන ප්‍රධාන ම දුෂ්කරතාවකි. හදිසියකදී පාරිභාෂිත වචනයක තේරුම සොයා ගැනීම අවශ්‍ය වුවහොත් ඒ ඒ විෂයට අදාළ ගැටපද විවරණයකින් එය සොයාගත යුතු ය. අවශ්‍ය විටක එය පහසුවෙන් සොයා ගත හැකිද යන්න සැක සහිත ය. මෙකී කරුණුවලට සාර්ථකව විසඳුම් ඉදිරිපත් කිරීමට තරුණයෝ සිව් දෙනෙක් සමත්වූහ. ඒ නවීන තාක්ෂණය උපයෝගී කරගෙන ය. ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට පරිගණක ආධාරයෙන් "තිබස්" නමින් සිංහල ඉංග්‍රීසි භාෂා පරිවර්තකයක් පරිගණක වැඩසටහනක් ලෙස ඉදිරිපත් කිරීම මෙම වෑයම යි. එය කොතරම් පරිගණක කළ ද මුද්‍රිත ශබ්දකෝෂ මෙන් ආපදාවලට ලක් නොවෙයි. ඉංග්‍රීසි වචන 100000 කට අධික ප්‍රමාණයකුත්, සිංහල වචන 130 000 කට අධික ප්‍රමාණයකුත් එහි අඩංගු ය. ගණකාධිකරණය, ව්‍යාපාර කළමනාකරණය, භූගෝල විද්‍යාව, මනෝවිද්‍යාව, බිම් මැනුම, රසායන විද්‍යාව, ගණිතය, භෞතික විද්‍යාව, සෞන්දර්ය අධ්‍යාපනය, නීතිය, පුස්තකාල විද්‍යාව, සිවිල් ඉංජිනේරු විද්‍යාව, යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව, ශිල්ප හා කර්මාන්ත සමාජ විද්‍යාව, මානව විද්‍යාව, රෙදි විවීම, කුඹල් කර්මාන්තය, තර්ක ශාස්ත්‍රය, දර්ශනය, සංඛ්‍යානය, වෛද්‍ය විද්‍යාව, විදුලි ඉංජිනේරු විද්‍යාව, පරිගණක විද්‍යාව හා කළමනාකරණය වැනි විෂයන් රැසක පාරිභාෂික වචන 35000 කට අධික ප්‍රමාණයක් "තිබස්" සිංහල - ඉංග්‍රීසි වචන පරිවර්තකයෙහි අඩංගු කොට තිබේ. සිංහල වචන පරිගණක යතුරු පුවරුව මගින් සටහන් කළ සැනින් එහි ඉංග්‍රීසි තේරුම ද, ඉංග්‍රීසි වචන සටහන් කළ සැනින් එහි සිංහල තේරුම ද මෙම වචන පරිවර්තකයෙන් ලබා ගත හැකි ය. සම්මත විජේසේකර යතුරු පුවරුව හෝ ශබ්දයට අනුරූප යතුරු පුවරුව හෝ භාවිත කරන්නාට රුචි පරිදි ඕනෑම ආකාරයක යතුරු පුවරුවක් හෝ සකසා ගැනීමේ පහසුකම් ද මෙහි සමන්විත ය. වින්ඩෝස් 95, 98 හා 2000 මෘදුකාංග ඇතුළත් පරිගණකවල මෙය පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි ය.



ජ්‍යෙෂ්ඨ කළමනාකාර
සම්පත් ගොඩමුන්න



ජ්‍යෙෂ්ඨ කළමනාකාර
රොහාන් මානමුදලි





ජ්‍යෙෂ්ඨ කළමනාකාර
ධම්මික විජේරත්න

පරිගණකයේ ඈඪංග තැටි පැදියේ වචන පරිවර්තකය තැන්පත් කිරීම සඳහා මෙගා බයිට්ස් 25 ක් තිබීම ප්‍රමාණවත් ය.

තොරතුරු තාක්ෂණය ඔස්සේ ශීඝ්‍ර දියුණුවක් කරා හඹා යන මෙවන් අවදියක ඉංජිනේරු විද්‍යාව හැදෑරූ තරුණයන් සිවුදෙනාගේ ප්‍රයත්නය විශිෂ්ඨ ය.

1988 අධ්‍යාපන වර්ෂය සඳහා සම්පත් ගොඩමුන්න හා විපුල ජයම්පති පේරාදෙණිය විශ්ව විද්‍යාලයටත්, ධම්මික විජේරත්න විවෘත විශ්ව විද්‍යාලයටත්, රෝහාන් මානමුදලි මොරටුව විශ්ව විද්‍යාලයටත් තේරී පත්විණි. මෙම ඉංජිනේරු ශිෂ්‍යයන් සිවු දෙනාටම එකළ පැවැති භීෂණකාරී සමයේ සරසවි වසා දැමීම නිසා නියමිත කලට සරසවියට ඇතුළුවීමට අවකාශ නොලැබිණි. එම කාලය අපතේ නොයවා සයන්ස් ලෑන්ඩ් නමින් ආයතනයක් ස්ථාපිත කොට සිංහල ඉංග්‍රීසි පද හසුරුවක් සකස් කොට නොමිලේ බෙදා හැරීමට මෙම තරුණයෝ පියවර ගත්හ. ලංකාවේ ප්‍රකට ආයතන විශාල සංඛ්‍යාවකට දහස් ගණනින් මෙලෙස පද හසුරු සැපයූහ. මෙලෙස පද හසුරුවක් මූලික අධ්‍යාපන ආයතනයට නොමිලේ ලබාදීමට ගිය විටක එහි ප්‍රධානත්වය හෙබවූ මහාචාර්ය සිරිල් පොන්නම්පෙරුම මහතාගේ ඇරයුම් පරිදි එම ආයතනයට සම්බන්ධවීමට තරුණයන්ට හැකි විය. සිංහල - ඉංග්‍රීසි පද හසුරුවට දෙමළ බස ද එක් කරන ලෙස මහාචාර්යවරයා කළ ඉල්ලීමට තරුණයෝ එකහෙළා එකඟ වූහ. එතැන් සිට ටික කලකින් භාෂා ත්‍රිත්වය ම ඇතුළත් පද හසුරුවක් නිකුත් කෙරිණි. එදා ඇරැඹි භාෂා ත්‍රිත්වයක පද හසුරුව සිංහල - ඉංග්‍රීසි වදන් පරිවර්තකයක් එළිදැක්වීම දක්වා අභියෝගාත්මක ගමනක මෙම යෞවනයන් සිවුදෙනා පැමිණ සිටිති. සයන්ස් ලෑන්ඩ් කෝපරේෂන් ප්‍රයිවට් ලිමිටඩ් නමින් ආයතනයක් ද මේ වනවිට සථාපිත කොට ඔවුහු ව්‍යාපාර ක්ෂේත්‍රයට ද අවතීර්ණව සිටිති.





**පද හසුරුව නිර්මාණය කිරීම සඳහා විපුල, සම්පත්, ධම්මික හා රෝහාන් එකතු වූ මොහොතක්. මෙය සයන්ස් ලෑන්ඩ් හි ආරම්භක යුගයේ ගත් ඡායාරූපයකි.**

නව නිෂ්පාදනය හා ඉදිරි සැලසුම් ගැන ක්‍රියාකාරි යොවනයන් සිව්දෙනාගෙන් එක් අයකු වන මෙම ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර **සම්පත් ගොඩමුත්ත** මහතා අප සමග අදහස් දක්වමින්.


"මටත් මගේ යහළුවන් තිදෙනාටත් අවශ්‍ය වුනේ යම් නිර්මාණශීලී දෙයක් කරන්නයි. ඊට අවශ්‍ය උනන්දුව හා කැපවීම අප තුළ තිබුණා. ඒ නිසයි මුල් කාලයේදී සිංහල ඉංග්‍රීසි පද හසුරුවක් නොමිලේ ලබාදුන්නේ. ඒ කාලයේදීම අපි කාර්යක්ෂමතාව වැඩි කළ හැකි පරිගණක වැඩසටහන් ද නිදහස් වෙළෙඳ කලාපයේ ඇඟළුම් කර්මාන්තවලට සකස් කර දුන්නා. එයින් විශිෂ්ට ප්‍රගතියක් එම ආයතනවලට ලැබුණා. වන්මන් ගමන දක්වා පැමිණීමට ශ්‍රී ලංකා ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථානයේ සභාපති ආචාර්ය බාලසූරිය හා ආචාර්ය රොමේෂ් ඩයස් බණ්ඩාරනායක මහත්වරුන්ගෙන් ලැබුණු සහය, මගපෙන්වීම හා ධෛර්යය නොවන්නට මෙවන් ගමන් පැමිණීම සිහිනයක්. අපි නිකම් දෙන්න ගිය පද හසුරුවට එපා කියද්දීත් රුපියල් 12500 ක් බලෙන් ම දුන්නා පමණක් නොව නොමිලේ පදහසුරුව නිකුත් නොකොට ව්‍යාපාර මට්ටමින් එය පවත්වාගෙන යන ලෙස උපදෙස් දී ඩයිනමික් රැම් ආයතනයට අපව හඳුන්වා දුන්නා. එහිදී අප සැපයූ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි ඇතුළත් තිබස් පද හසුරුව එම ආයතනය මගින් රටපුරා බෙදාහරියා. එහි **රේ වේලාරත්න** හා **මණික් විජේරත්න** යන මහත්වරු අපට උපරිම සහය දුන්නා. එතකොට අපි විශ්ව විද්‍යාලයේ ඉගෙනගත්තවා. අප සපයන පද හසුරුව කිසිවකුටත් පිටපත් කරගත නොහැකි ලෙස මෘදුකාංග අගුලක් ද ප්‍රථම වතාවට හඳුන්වා දුන්නා. මෙම පද හසුරුව පිළිබඳ පර්යේෂණ හා අත්හදා බැලීම් කොට විටින් විට සංවර්ධනය ද කළා. 1994 දී ඩයිනමික් රැම් සමාගමෙන් ඉවත්ව වන්මන් ආයතනය ආරම්භ කළා. ඊට මූල්‍ය ආයෝජනය කරමින් පුරෝගාමී වූයේ ආචාර්ය රොමේෂ් ඩයස් බණ්ඩාරනායක මහතා සහ කපිතාන් එඩ්වඩ් පෙරේරා මහතා යි. මේ වනවිට තිබස් පද හසුරුවන 6000 ත් 7000 ත් අතර ප්‍රමාණයක් වෙළෙඳපොළට රුපියල් 22725 බැගින් නිකුත් කොට තිබෙනවා.

වින්ඩෝස් වැඩසටහන් සඳහා සිංහල දෙමළ පාවිච්චි කිරීමේ හැකියාව දක්වා තිබස් වැඩිදියුණු කළා. සිංහල භාෂාව සඳහා පමණක් දැනට අක්ෂර වින්‍යාසය නිවැරදිව සොයන ක්‍රමයක් සකස් කර තිබෙනවා. එය දෙමළ භාෂාව දක්වා දියුණු කරන්නට උත්සාහ කර අවසාන යි. ලංකා ඉන්ටර්නෙට් ආයතනය සමග එක්ව සිංහල භාෂාවෙන් ප්‍රථම වරට විද්‍යුත් තැපැල් (ඊ මේල්) හඳුන්වා දීමේ ගෞරවය හිමිවන්නේ ද අපට යි. අන්තර්ජාල මගින් "මානව" නමින් ප්‍රථම වරට සිංහල සඟරාවක් නිකුත් කිරීමට තරම් අප ශක්තිමත් වුණා. ඕනෑම සිංහල වචනයක්, නමක් ආකාරදි පිළිවෙලට තිබස් වැඩසටහන මගින් පෙළගැස්විය හැකියි. එය දෙමළ භාෂාව දක්වා ව්‍යාප්ත කිරීම අපේ අරමුණ යි.

අලුතින් හඳුන්වාදුන් සිංහල ඉංග්‍රීසි වචන පරිවර්තනය, අප පැමිණි ගමන් මගේ එක්තරා සන්ධිස්ථානයක්. වසර 2 ක පමණ කාලයක් ඒ පිළිබඳ පර්යේෂණ කොට ලත් ප්‍රතිඵලයක් ලෙසයි, මේ අයුරින් එය නිකුත් කළේ. සෑම සිංහල වචනයකට ම ඉංග්‍රීසි වචන ද ඉංග්‍රීසි වචනයකට ම සිංහල වචනය ද මෙමගින් සොයාගත හැකියි. නියමිත ඉංග්‍රීසි වචනය පැහැදිලිව උච්චාරණය ද කෙරෙනවා. සිංහල භාෂා උච්චාරණ රටාවත් ඉදිරියේ දී එයට ඇතුළත් කරනවා. එවිට සිංහල භාෂාව ඉගෙන ගැනීමට රුචියක් දක්වන විදේශිකයන්ට පමණක් නොව විදේශවල ඉපදී ඒ පරිසරවල හැදී වැඩෙන ලාංකික දරුවන්ට මව් භාෂාව පිළිබඳ ඉගෙනුමට ද අවකාශ සැලසෙනවා. මීට දෙමළ භාෂාව ද ඇතුළත් කිරීමට පියවර ගන්නවා.

රාජ්‍ය ආයතනවල විශාල තොරතුරු පද්ධති තිබෙනවා. අවාසනාවකට එය තියෙන්නේ ඉංග්‍රීසි බසින් නමුත් එම ආයතනය බහුතරයක් ගනුදෙනු කරන්නේ සිංහලෙන්. එකී ඕනෑම තොරතුරක් සිංහල ආකාරදිය පිළිවෙලට සකස් කිරීමට තරම් ශක්තියක් හා හැකියාවක් අප සතු යි. එවැනි කාර්යයන් ගණනාවකට අනගසා තිබෙනවා. එම තොරතුරු පද්ධති වලින් පෙරට වඩා විශාල ප්‍රතිඵල එම ආයතනවලට ලබා ගත හැකියි. සිංහල දෙමළ භාෂා පරිවර්තකයන් සැකසීමට දැනටමත් සැලසුම්කොට අවසාන යි. අත්හදා බැලීම් ද සාර්ථක යි. එයට ඉංග්‍රීසි බස ද මුසු කරනවා. සිංහල, දෙමළ දෙජාතියට ම භාෂා නොදැනීමේ දුෂ්කරතාවට විසඳුම් මෙමගින් සපයනවා.

මෙය හැකි ඉක්මනින් සමාජයට හඳුන්වා දෙන ලෙස තැපැල් විදුලිසංදේශ හා ජනමාධ්‍ය ඇමැති මංගල සමරවීර මහතා ද අපෙන් පෞද්ගලිකව ම ඉල්ලීමක් කළා.



දුරස්ථව සිටින ජාතිය එකිනෙකා හා සමීප කිරීමට මෙමගින් ඉහළ අවකාශයක් සැලසෙන බව එතුමා අවධාරණය කළා. අපගේ ව්‍යායාමයට හැකි සෑම සහයෝගයක් ම රජය වෙනුවෙන් ලබාදීමට පොරොන්දු වුණා. එය අපට ශක්තියක්, ධෛර්යයක්.

අද බොහෝවිට ජාත්‍යන්තර වශයෙන් පවා හඩ නගන ඉංග්‍රීසි වචන පරිගණකයෙන් හඳුනාගෙන තිරය මත යතුරුලියනය වන ක්‍රමය දැකිය හැකියි. එය සිංහල භාෂාව දක්වා වර්ධනය කරන්නට අපේක්ෂා කරනවා.

ඇමරිකාව, එංගලන්තය, ජර්මනිය, නවසීලන්තය වැනි රටවල් රැසක අපේ ගනුදෙනුකරුවන් ඉන්නවා. 1988 සුළුවෙන් ඇරඹි සිංහල ඉංග්‍රීසි පද හසුරුව විවිධ අත්හද බැලීම් හා පර්යේෂණ ඔස්සේ සංවර්ධන කඩඉම් පසු කරමින් දෙමළ භාෂාව ද ඇතුළත් වෙමින් ඉතා දියුණු මට්ටමකට තිබස් පද හසුරුව දියුණු කොට තිබෙනවා. තිබස් ඕනෑම අයකුට ඊට සම්බන්ධ සියලු පහසුකම් භුක්ති විඳිය හැකි යි.

එසේත් නැත්නම් රුපියල් 5500 ක් වැනි මුදලකට සිංහල ඉංග්‍රීසි වදන් පරිවර්තකය පමණක් ද මිලදී ගත හැකි යි.

සයන්ස් ලෑන්ඩ් කෝපරේෂන් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයට අමතරව පරිගණක අධ්‍යාපනය ලබාදීම සඳහා සයන්ස් ලෑන්ඩ් ඉන්ෆොමේෂන් ටෙක්නොලජි ප්‍රයිවට් ලිමිටඩ් නමින් ආයෝජන මණ්ඩල අනුමැතිය ලද සමාගමක් ද, පරිගණක වැඩසටහන් සඳහා සයන්ස් ලෑන්ඩ් සොෆ්ට්වෙයාර් ප්‍රයිවට් ලිමිටඩ් නමින් තවත් සමාගමක් ද පවත්වාගෙන යනවා.

සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා යොදාගනිමින් උපරිම ඵලයක් ලබා ගැනීමට හැකිවන පරිදි ජනතාවට ඉඩ ප්‍රස්ථා සැලසීම අප හමුවේ ඇති ප්‍රධාන අභියෝගය යි. එය ජය ගැනීමේ ශක්තිය හා හැකියාව අප සතුව නොඅඩුව තිබීමත් ආඩම්බරයක්.

සටහන -

**සමන්ත මල්ලවආරච්චි**

**නවයුගය**